# 2020/11/10 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2020/11/10 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

## 01. ආගම සිහි කිරීම

2020.11.10 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

මේ අවස්ථාවට සහභාගිවෙන උපසභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලගෙන් අවසරයි. අද දින නාගොඩ ප්‍රාදේශීය සභාවෙ මහා සභාව මෙවැනි ආකාරයට පවත්වන්නේ, ඔබ අපි කවුරුත් දන්නවා. කොවිඩ් ව්‍යාප්තිය දෙවනි රැල්ල ඇතිවී තියෙන මොහොතක තමයි. අපි අපේ සභාවාරය පවත්වන්නේ. ඒ අනුව නිරෝධායන නීති රීති වලට අනුගතව තමයි අපිට මේ කටයුත්ත සිදු කරන්න වෙලා තියෙන්නෙ. ඒ අනුව අද මේ වසංගත තත්වය හමුවේ වුනත් තමන්ගෙ බල ප්‍රදේශයේ වැඩකටයුතු කරන්නට අපට දීපු බලතල අනුව අපේ කටයුත්ත කිරීමට බැඳී සිටින බැවින්, අපේ සභා රැස්වීම පවත්වන්න මේ අවස්ථාවෙ සහභාගිවෙලා ඉන්න උප සභාපතිතුමා මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නවා. අද දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප.ව. 1.00 ට විශේෂ සංවර්ධන කමිටු රැස්වීම තියෙනවා. එයට අපි සියලු මන්ත්‍රීවරුන් සහභාගී විය යුතු නිසා, ප.ව.1.00 වන විට අපේ සභා රැස්වීමේ කටයුතු නිමා කරලා, සංවර්ධන කමිටුවට යාමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ගෙන් ඉල්ලා සිටිනවා. අදාල කරුණු පමණක් සාකච්ඡා කරලා, ඒ අනුව කටයුතු කරන්න කියලා. එහෙමනම් ඔබ සියලු දෙනාම නැවත වරක් පිළිගනිමින්, සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා සංවර්ධන කමිටුවට සහභාගි වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**(අ)01. 2020.10.13 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත.**

**2020.10.13 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී අජිත් එඬේරආරච්චි මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. හිටපු **දකුණු** පළාත් ගරු මන්ත්‍රී සුමනසිරි ලියනගේ මහතා විසින් කොතලාවල නො.50 බොරළුකන්ද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා ප්‍රතිසංස්කරණය කිරීම යන මැයෙන් යොමු කරන ලද 2020.10.27 දිනැති ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

02. ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේර මහත්මිය විසින් 212 ඒ කැප්පිටියාගොඩ උතුර ග්‍රාම සේවා වසමේ කරව්වකන්ද, පඹේදෙණිය ප්‍රධාන මාර්ගය අවධානම් තත්වය සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

03. හිටපු නාගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.ජී. අරුණ ශාන්ති මහත්මිය විසින් නව සභිකවරියට සුභ පතා 2020.11.09 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

04. ගිංසොබා ප්‍රජා මූල සංවිධානය, කැප්පිටියාගොඩ, ගා/නාගොඩ විසින් පානීය ජල ව්‍යාපෘතිය සඳහා ගල් කොරියකින් හානි පැමිණීම සම්බන්ධව 2020.10.23 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

05. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් කොවිඩ් 19 වසංගතය මර්ධනය සඳහා සිදු කළ යුතු විශේෂ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් 2020.10.27 දිනැතිව යොමු කරන ලද උපදෙස් අඩංගු ලිපිය සභාගත කරන ලදී.

06. ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් තුන්හවුල්කැල්ල, මහගෙදරවත්ත පාර හරහා ඇති ලී පාලම අළුත්වැඩියා කිරීම සම්බන්ධව 2020.11.10 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

07. ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් විනිමුල්ලන්ද කිරිමැටිය පාර ජේ.සී.බී. යන්ත්‍රයක් යොදවා අළුත්වැඩියා කිරීම සම්බන්ධව 2020.11.10 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

08. අලුත් ඉහළ, මාපලගම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී, ඊ.ජී. රේණුකා මල්කාන්ති මිය විසින් කැටගොඩ සායනය අවට වටපිටාව පවිත්‍ර කර ගැනීම සම්බන්ධව 2020.11.07 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

09. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, ගාල්ල විසින් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන රට හදන සෞභාග්‍යයේ දැක්ම අනුව කි.මී. 100000 ක් අභ්‍යන්තර හා ග්‍රාමීය මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම යන මැයෙන් 2020.11.05 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

10. ආර්.ආර්.එම්.ඩී.කේ.බී. දුනුවිල, ප්‍රධාන පොලිස් පරීක්ෂක, පොලිස් ස්ථානය, නෙළුව විසින් 2020.11.10 දිනැතිව යොමු කරන ලද අවමංගල්‍යය ස්තූති ලිපිය සභාගත කරන ලදී.

11. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් රාජ්‍ය අංශයේ ආයතන සඳහා අනුමත තනතුරුවලට බඳවා ගැනීම/පුරප්පාඩු පිරවීම යන මැයෙන් 2020.11.04 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගතකරන ලදි.

ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා ඉහත ලිපියට අනුව සේවකයන් බඳවා ගැනීම හා දැනට කොන්ත්‍රාත් හා අනියම් පදනම යටතේ, සභාවල සේවය කරන අයවලුන් ස්ථිර කිරීම සම්බන්ධයෙන්, රජයේ රැකියා ලක්ෂයක් ලබා දීමේ වැඩපිළිවෙල යටතේ ගැටලුවක් මතුවෙන බව පෙන්වා දෙමින්, දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර, ගරු සභාපතිතුමා ප්‍රකාශ කලේ, මෙය අපට පමණක් බලපාන ප්‍රශ්නයක් නොවන බවත්, ලංකාවේ සෑම ප්‍රාදේශීය සභාවකටම පැන නැගී ඇති ගැටලුවක් බැවින්, මේ සම්බන්ධව සභාපතිවරුන්ගේ සංසදයෙදී සාකච්ඡා කර කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවයි'

12. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් විශේෂ සංවර්ධන කමිටු රැස්වීම - නාගොඩ යන මැයෙන් 2020.11.05 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. 2021 වර්ෂයට අදාලව නාගොඩ ප්‍රාදේශීය සභා අයවැය කෙටුම්පත සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා, ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා පවතින වාතාවරණය යටතේ අයවැය කෙටුම්පතේ සෞඛ්‍ය සේවා ශීර්ෂය යටතේ ඉදිරියේදී අවශ්‍ය වුවොත්, ජනතාවට සහන සැලසීම සඳහා සෞඛ්‍ය හා පෝෂණ යනුවෙන් ඡේදයක් එකතු කොට ලක්ෂ 20 ක් වෙන් කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.**

**ඉහත සංශෝධනයට යටත්ව ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. පුරනැගුම ව්‍යාපෘතිය මගින් ඉදි කරන ලද උඩුගම මහජන පොලේ ගොඩනැගිල්ල වෙත වෙළඳුන් යොමු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉදි කරන ලද කඩ කාමරවලට අමතරව අවශ්‍ය ඉතිරි කඩ කාමර පෙළ ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඊ.ඒ. වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු පෙර පාසල් පාලිකාවන් සඳහා කොවිඩ් 19 වසංගත තත්වය නිසා පෙර පාසල් වසා තබන කාලය තුල දීමනාව ලබාදීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඊ.ඒ. වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛ (මුදල්) 01/2020 හා 2020.10.02 දිනැති ලිපියට අනුව 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට යෝජනා කරන අතර, සමීක්ෂණ මණ්ඩලය සඳහා පහත නම් සඳහන් සභිකයින් පත් කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

1. ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
2. ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය
3. ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 41 දක්වා ඇති ඉදිරි ගෙවීම් සභා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**2020.11.10 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2020 ඔක්තෝම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 258.30 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 9562.80 |
| 8617046104 | - උඩුගම බහුකාර්‍ය මධ්‍යස්ථානය | - රු. 1264.80 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1740.60 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1557.60 |
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 45109082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 258.30 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 789.00 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගණය | - රු. 240.00 |

**2020 සැප්තැම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2813189405 | -තල්ගස්වල පෙර පාසල | - රු. 313.20 |

**02. 2020 සැප්තැම්බර් මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912296537 | - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම | - රු. 3636.20 |
| ii. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 4317.96 |
| iii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 422.98 |
| iv. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 4685.39 |

**03.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

| | | |
|---|---|---|
| 33/53/003/008/11 | - උඩුගම උප කාර්යාලය (2020.09.21 – 2020.10.21) | -රු. 1173.96 |
| 33/53/003/009/10 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.09.21- 2020.10.21) | -රු. 2543.29 |

**04. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**
උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම 091-5701722
(2020.09.16- 2020.10.15) - රු. 613.01

**05 .2020 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 2316.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**06. 2020 ඔක්තෝම්බර් මස ගමන් වියදම්**
**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| ඒ.ඒස්.මසීදා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 6020.00 |

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 2000.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 950.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 1050.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 3500.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 3625.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 1880.00 |

**07. අතිකාල දීමනා ගෙවීම්**

**2020 ඔක්තෝම්බර් මස**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.40 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 972.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8500.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 6885.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 6933.12 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 5254.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2431.60 |
| කේ.එච්.එම්. නිශාන්ත ඉදුනිල් මයා | - අනියම් රියදුරු | - රු. 5963.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8360.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 9046.00 |
| කේ.පී.ජී.ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1041.60 |
| එම්.එම්.මහින්දදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1083.30 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - අනියම් විදුලි කාර්මික | - රු. 630.00 |
| යූ.ජී.රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2975.00 |

**අතිකාල දීමනා ගෙවීම්**

**2020 සැප්තැම්බර් මස**

| | | |
|---|---|---|
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - අනියම් විදුලි කාර්මික | - රු. 1050.00 |

**08. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

| | | |
|---|---|---|
| i. | 2020.10.27 තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා නිලධාරීන්ට දීමනා ගෙවීම | - රු. 3000.00 |
| ii. | සුළු අක්මුදල් ගිණුම ප්‍රතිපූර්ණය කිරීම | - රු. 4971.00 |
| iii. | 2020 ඔක්තෝම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත | - රු. 78000.00 |
| iv. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මන්ත්‍රීවරුන්ට සහ කාර්ය මණ්ඩලය සඳහා මුඛ ආවරණ ලබා දීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම | - රු. 1500.00 |

**09. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**2020 ඔක්තෝම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 583ක් - රු. 60632.00
252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 220 ක් - රු. 22880.00
LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 110 ක් - රු. 11440.00
LL 7366 ට්‍රක් බවුසර් රථය ඩීසල් ලීටර් 50 ක් - රු. 5200.00
RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 160 ක් - රු. 16640.00
RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 31 ක් - රු. 3224.00
DS 40 Oil 1L - රු. 750.00
ජලභීතිකා රෝග මර්ධනය පෙට්‍රල් ලීටර් 75 - රු. 10275.00
2T Oil 650ml - රු. 650.00
එංජින් ඔයිල් ලීටර් 1 - රු. 540.00
ඩීසල් ලීටර් 196 - රු. 20384.00

ගබඩාව පෙට්‍රල් ලීටර් 25 - රු. 3425.00
ගබඩාව විෂබීජනාශක දියර ලීටර් 05 - රු. 1000.00

**එකතුව** **- <u>රු.157040.00</u>**

**10.නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**

i. 2020.10.22 දින කැඳවූ එස් පී 138 දරණ නඩුවට අදාළව වෙනුවෙන් නීතිඥ හා පෙනී සිටීමේ, පෙරකලාසි ගාස්තු - රු. 8500.00
ii. 2020.10.22 දින එම් 343 (තල්ගස්වල සති පොළ) නඩුවේ නීතිඥ සහ අධිනීතිඥ ගාස්තු - රු. 10000.00

**11. ඒ.ඩී.කරුණාරත්න මයා, නාගොඩ**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 ඔක්තෝම්බර් - රු. 7050.00

**12. එම්.ඒ. සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 අගෝස්තු - රු. 2520.00
2020 සැප්තැම්බර් - රු. 2300.00

**13. එම්.ඒ. සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 ජුනි - රු. 2030.00
2020 ජූලි - රු. 2260.00

**14. බී.ජේ. කරුණාරත්න මයා, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 ජුනි - රු. 4210.00
2020 ජූලි - රු. 5260.00
2020 අගෝස්තු - රු. 5270.00
2020 සැප්තැම්බර් - රු. 5020.00

**15.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 ඔක්තෝම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු27500.00

ii. 2020 ඔක්තෝම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු.4200.00

**16. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා නොවැම්බර් මස මාසික කුලීය ගෙවීම- රු. 5000.00

**17. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

පී එෆ් 7360 කැබ් රථයේ සේවා කිරීමේ බිල්පත පියවීම - රු. 19140.00

**18. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

i. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා බූට්ස් 8 ක් මිළදී ගැනීමේ බිල්පත - රු.10800.00

ii. කොවිඩ් මර්ධනය සඳහා මාපලගම ආයුර්වේදයට පොලිතීන් ආවරණයක් යෙදීමට අවශ්‍ය උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 1860.00

iii. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය උපකරණ (සවල් 6, වීල් බැරෝ 02) මිළදී ගැනීමේ බිල්පත - රු.11962.00

iv. ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශයේ වහළ අළුත්වැඩියා කිරීමට අදාළ ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 36485.00

**19. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**

i. ප්‍රාදේශීය සභාවේ 2020.10.13 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 6340.00

**20. ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2020 ඔක්තෝම්බර් - රු. 5250.00

**21. සඳුන් චතුරංග මයා, ඊබේස් කම්පියුටර් ටෙක්නොලොජි, මාපලගම**

පුස්තකාලයේ පරිගණකය සඳහා අන්තර්ජාල පහසුකම් සඳහා OS සම්බන්ධතාවය ලබා ගැනීමේ බිල්පත - රු. 1250.00

සංවර්ධන අංශයේ පරිගණකයේ මෘදුකාංග අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 1250.00

ආයතන අංශයේ පරිගණකයේ මෘදුකාංග අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 1250.00

තාක්ෂණික අංශයේ පරිගණකයට මවුසයක් මිළදී ගැනීමේ බිල්පත - රු. 550.00

**22. කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්, යක්කලමුල්ල**

i. වීථි පහන් උපාංග ලබා ගැනීමේ බිල්පත - රු. 7664.20

ii. වීථි පහන් උපාංග ලබා ගැනීමේ බිල්පත - රු. 53070.25

**23. සදරු ග්‍රයින්ඩ් ඇන්ඩ් ග්‍රොසරි, නාගොඩ**

i. ප්‍රාදේශීය සභාවේ 2020.09.08 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 2643.00

**24. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**

i. තණකොළ කපන යන්ත්‍රය සඳහා තල මිළදී ගැනීමේ බිල්පත - රු. 2450.00

ii. සෞඛ්‍ය කම්කරුවන් සඳහා ඉදල් ලබා ගැනීමේ බිල්පත - රු. 1950.00

iii. ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශයේ විදුලි පංකා සවි කිරීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීමේ බිල්පත - රු. 1750.00

**25. විගණකාධිපති, විගණන කාර්යාලය**

i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

ii. 2019.01.01 සිට 2019.121.31 දක්වා විගණන ගාස්තු - රු.135600.00

**26. සිරිවර්ධන සපෝටින් ඇන්ඩ් ප්‍රඩක්ට්ස්, තල්ගස්වල**

පැඩලය සහිත සින්ක් 03 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 25500.00

**27. අරුණ ඉලෙක්ට්‍රිකල්ස්, යක්කලමුල්ල**

වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ලයින් ටැප් 100 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 16500.00

**28. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 ඔක්තෝම්බර්) - රු.13000.00

**29. ඒ.ජේ.ජී. ස්ටේෂනර්ස්, ගාල්ල**

ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල්පත - රු.33822.50

**30.ලයන් ෆොටෝ, ගාල්ල**

කාර්ය මණ්ඩලය සඳහා හැඳුනුම්පත් 04 ක් සකස් කිරීමේ බිල්පත - රු. 1760.00

**31. යුනයිටඩ් ෆාමසි, ගාල්ල**

කොවිඩ් 19 සෞඛ්‍යාරක්ෂිත උපකරණ මිලදී ගැනීමේ බිල්පත - රු.40300.00

**32. ඩිබග් කම්පියුටර් පුද්ගලික සමාගම, කුරුනෑගල**

ප්‍රින්ටර්ස් 03 ක් සේවා කිරීමේ බිල්පත - රු. 14904.00

**33. අරුණ ඉලෙක්ට්‍රිකල්ස්, යක්කලමුල්ල**

වීථි පහන් අළුත්වැඩියාව සඳහා 1.044 වයර් කොයිල් 10 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 17900.00

**34. ගෙස්ටෙට්නර් ඔෆ් සීඑල්සී, කොළඹ**

MP 2001L ෆොටෝ කොපි යන්ත්‍රය වාර්ෂික සේවා කිරීමේ ගිවිසුම - රු. 14580.00

**35. ජයවර්ධන හාඩ්වෙයාර්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා සින්ක් එකක් ලබා ගැනීමේ බිල්පත - රු. 998.00

**36.සවුත්නෙට් පුද්ගලික සමාගම**

ප්‍රින්ටර් අළුත්වැඩියාව කිරීමේ බිල්පත - රු. 3800.00

**37. නිව් විජය මෝටර්ස්, ගාල්ල**

පී එෆ් 7360 කැබ් රථය සඳහා අලුතින් ටයර් 4 ක් මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම - රු.146000.00

**පොදු අරමුදල් කර්මාන්ත**

**38. ශ්‍රීමාල් සුරංග මයා, උඩලමත්ත**

උඩලමත්ත අලුත්හේන ධර්මදූත බෞද්ධ මධ්‍යස්ථාන මාර්ගය ස්කවේටර් යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 5105.00

**39. නිහාල් නෙල්සන් ජයවික්‍රම මයා,**
ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශයේ වහල අළුත්වැඩියා කිරීමට අවශ්‍ය දැව ඉරීම සඳහා වැය වු බිල්පත පියවීම - රු. 3200.00

**40. ආර්.පී.කේ.අබේසිංහ මයා, යටලමත්ත**
ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශයේ වහල අළුත්වැඩියා කිරීමට අවශ්‍ය උපකරණ ලබා දීම වෙනුවෙන් වැය වු බිල්පත පියවීම - රු. 1900.00

**රජයේ ආධාර**
**ග්‍රාමීය මාර්ග කි.මී.1000 සංවර්ධනය - 2019**
**41.ප්‍රියදර්ශනාරාම වැඩිහිටි සමිතිය, හඟරන්වල, නාකියාදෙණිය**
හෝම්දොලවත්ත නො.02 වතු නිවාසවලට යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම - රු. 49514.64

2020.10.13 දින පවත්වනු ලැබූ මහා සභා රැස්වීම සඳහා ඉදිරිපත් කල ඉදිරි ගෙවීම් වාර්තාවේ අංක 24 (ii) හි සඳහන් සංග්‍රහ බිල්පත සඳරු ග්‍රයින්ඩින් මිල්ස් ඇන්ඩ් ග්‍රොසරි නමින් සංශෝධනය වය යුතු බව දන්වා සිටිමි.

2020.10.13 දින පවත්වනු ලැබූ මහා සභා රැස්වීම සඳහා ඉදිරිපත් කල ඉදිරි ගෙවීම් වාර්තාවේ අංක 02 යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී බිල්පත් 2020 සැප්තැම්බර් මස දූරකථන බිල්පත් ලෙස සටහන් වී ඇති නමුත් එය 2020 අගෝස්තු මස දූරකථන බිල්පත් ලෙස සංශෝධනය විය යුතු බව දන්වා සිටිමි.

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**
**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මදූසංක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**
01. දැඩි ලෙස අබලන්ව ඇති කිඹුල්කොටුකන්ද මාර්ගය සඳහා කොරි පස් දමා සංවර්ධනය කිරීම
**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. 214 ඒ ග්‍රාම නිලධාරී වසමේ වදගොඩහේන මාර්ගයේ වතුර බැස නොයන ස්ථාන 5 ක් සඳහා බෝක්කු යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. උඩුගම නැගෙනහිර ගුණානන්ද මාවත බංගම මාර්ගයට සම්බන්ධ වේ. මෙම මාර්ගයේ අඩි 28 ක පමණ කුඩා ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට ඉතිරිව ඇත. එම කොටස දැනට මඩ වගුරක් ලෙස පැවතීම නිසා කොන්ක්‍රීට් කර සංවර්ධනය කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. අලුත්වත්ත කොට්ඨාසයට අයත් උඩුගම දකුණ හොරවංගුව ස්ථානයේ සිට අලුත්වත්ත 18 බෞද්ධ මධ්‍යස්ථානය දක්වා උඩුගම ගාල්ල ප්‍රධාන මාර්ගයේ සිට ගම්මානවලට පිවිසෙන අතුරු මාර්ග හා උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම් මැදින් දිවෙන උඩුගම බංගම ප්‍රධාන මාර්ගයේ සිට ගම්මානවලට පිවිසෙන අතුරු මාර්ගද නාම පුවරු මගින් නම් කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. උඩුගම නැගෙනහිර අක්කර 80 ජනසවිය ගම්මානයේ අතුරු මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා සකසා දෙන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ ආරම්භයේ සිට උඩුගම බංගම මාර්ගයේ ප්‍රා දේශීය සභා සීමාව දක්වා අත්‍යාවශ්‍ය ස්ථානවලත් අල්ත්වත්ත උඩුගංකැල්ල මාර්ගයේ හා කැකිරිහේනගල මාර්ගයේත් අවශ්‍යම ස්ථානවලටත්, උඩුගම දකුණ පියතිලක මාවත සිට මිනිරංවල කන්ද දක්වාත් අවශ්‍යම ස්ථානවලට අලුතින් වීථි පහන් සවි කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. දියවර ගම්මානයේ 6 වෙනි පටුමගේ අතුරු මාර්ගයට අඩි 8 සිළිංඩරයක් ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

| | |
|---|---|
| 01. අශෝකාරාම විහාරස්ථානය අසළ කාණුව සඳහා සිළිංඩර් යෙදීම | - රු. 34000.00 |
| 02. ගෝණලගොඩ ගඟ අද්දර බෙම්මුල්ලවත්ත මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම | - රු. 13100.00 |
| 03. කුරුඳුකැටිය මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම | - රු. 6550.00 |
| 04.රඹුප්පොත මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම | - රු. 14550.00 |

05. ගුලනවිල රදාදෙනිය මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම - රු. 6550.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. නාගොඩ මොටදෙනියන්ගේ මාර්ගය කොන්ක්‍රීට් කිරීම -රු.3,100,000.00
07. ගෝනලගොඩ කිතුල්දූව නියාගම මාර්ගයේ ගිලා බැස ඇති ස්ථානය කොරි පස් දමා සංවර්ධනය කිරීම - රු. 3650.00
08. ගම්මැද්දේගොඩ උතුර බතලවත්තේගොඩ මාර්ගයේ ගිලා බැස ඇති මාර්ගය පැති බැම්මක් යොදා සකස් කිරීම - රු. 126,000.00
09. උඩුගම නැගෙනහිර ගුණානන්ද මාවතේ කොටසක් කොන්ක්‍රීට් කිරීම- රු. 45000.00
10. උඩුගම අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසමේ 18 කන්ද බෞද්ධ මධ්‍යස්ථානය ඉදිරිපිටින් එම ගම්මානයට යාමට ඇති මාර්ගය ජේ.සී.බී.යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම- රු. 10000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

<u>කොවිඩ් 19 වැලැක්වීම සඳහා ආයතන වලට අවශ්‍ය උපාංග වෙනුවෙන් ලැබී ඇති මිල ගනන්</u>

| <u>විස්තරය</u> | **සමුපකාර රෝහල - ගාල්ල** | **<u>සිටි ෆාමසි - ගාල්ල</u>** | **නිවු ලොයිඩ් ෆාමසි - ගාල්ල** | **ක්‍රිස්ටල් ෆාමසි - ගාල්ල** | **යුනයිටඩ් ෆාම - ගාල්ල** |
|---|---|---|---|---|---|
| උෂ්නත්වමාන (Thermometer infared) | 6500.00 3mon | 8950.00 1yer | 6800.00 1yer 9500.00 1yer 11800.00 2yer | 6000.00 6mon 10000.001yer | 5500.00 6mon 6900.00 1yer |
| සෞඛ්‍යාරක්ෂිත ඇඳුම් (PPE kit) | 3500.00 | 1000.00 | 1200.00 | | 200.00 (පොලිතීන්) 750.00 |
| විෂබීජ හරන දියර (sanitizer) 4L | 3500.00 | 4800.00 | 5000.00 | | 4400.00 |
| මුහුණු පලිහ | | | | | 250.00 |

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ කොවිඩ් 19 වැලැක්වීම සඳහා ආයතන වලට අවශ්‍ය උපාංග ලබා ගැනීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල යුනයිටඩ් ෆාමා -**

ගාල්ල විසින් කොවිඩ් 19 වැලැක්වීම සදහා ආයතන වලට අවශ්‍ය උපාංග ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව යුනයිටඩ් ෆාමා - ගාල්ල වෙතින් කොවිඩ් 19 වැලැක්වීම සදහා ආයතන වලට අවශ්‍ය උපාංග ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

<u>කොවිඩ් 19 වැලැක්වීම සදහා ආයතන වලට අවශ්‍ය උපාංග වෙනුවෙන් ලැබී ඇති මිල ගනන්</u>

| <u>විස්තරය</u> | සිරිවර්ධන සපෝට්න් සහ නිෂ්පාදන - හොරන්ගල්ල | <u>දයානි ට්‍රේඩ් සෙන්ටර් මාපලගම</u> | නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ | බණ්ඩාරිගොඩ කන්ස්ට්‍රක්ෂන් |
|---|---|---|---|---|
| අත සෝදන සින්ක් ස්ටෑන්ඩ්, සින්ක්, ටැප් ,පා පැඩලය සහිත | 8500.00 | 9500.00 | 10000.00 | Simple edition - 12800.00<br>Smart edition – 14800.00<br>SS edition - 15800.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ කොවිඩ් 19 වැලැක්වීම සදහා ආයතන වලට අවශ්‍ය උපාංග ලබා ගැනීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල සිරිවර්ධන සපෝට්න් සහ නිෂ්පාදන - හොරන්ගල්ල විසින් කොවිඩ් 19 වැලැක්වීම සදහා ආයතන වලට අවශ්‍ය උපාංග ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව සිරිවර්ධන සපෝට්න් සහ නිෂ්පාදන - හොරන්ගල්ල වෙතින් කොවිඩ් 19 වැලැක්වීම සදහා ආයතන වලට අවශ්‍ය උපාංග ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සදහා ප්‍රින්ටර් යන්ත්‍රයක් මිලදී ගැනීම සදහා ලැබී ඇති මිල ගනන්</u>

| <u>විස්තරය</u> | <u>ප්‍රිව්ව් කම්පියුටර් ටෙක්නොලජී - වදුරඹ</u> | <u>රුචිර කම්පියුටර්ස් - නාගොඩ</u> | <u>ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම</u> |
|---|---|---|---|
| <u>පරිගනක ප්‍රින්ටර් සදහා</u> | Hp – 18500.00 | Canon -18000.00 | Canon -17500.00<br>Hp – 17500.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා ප්‍රින්ටර් යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම විසින් ප්‍රධාන කාර්යාලය සඳහා ප්‍රින්ටර් යන්ත්‍රයක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම වෙතින් ප්‍රධාන කාර්යාලය සඳහා ප්‍රින්ටර් යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ පරිගනක යන්ත්‍ර සේවා කිරීම සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම | ප්‍රිව්ව් කම්පියුටර් ටෙක්නොලජී - වදුරඹ | රුචිර කම්පියුටර්ස් - නාගොඩ |
|---|---|---|---|
| පරිගණක යන්ත්‍ර සේවා කිරීම එක් පරිගණකයක් සඳහා | 2000.00 | 2500.00 | 2400.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පරිගණක යන්ත්‍ර සේවා කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පරිගණක යන්ත්‍ර සේවා කිරීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ඊ බේස් කොම්පියුටර් ටෙක්නොලජී - මාපලගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පරිගණක යන්ත්‍ර සේවා කිරීම සුදුසු බව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>**PF 7360** කැබ් රථය සඳහා අවශ්‍ය **maxis** ටයර් **4** ගෙන්වීම සඳහා ලැබී ඇති මිළ ගනන්</u>

| විස්තරය | ගෝල් බැටරි හවුස්, මාගාල්ල | නිව් විජය මෝටර්ස්, ගාල්ල | හසිත ටයර් සර්විස්, ගාල්ල |
|---|---|---|---|
| PF 7360 කැබ් රථය සඳහා අවශ්‍ය maxis ටයර් 4 ගෙන්වීම | රු. 39000.00 | රු. 36500.00 | රු. 38200.00 |

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ PF 7360 කැබ් රථය සඳහා අවශ්‍ය maxis ටයර් 4 ගෙන්වීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මෝටර්ස්, ගාල්ල විසින් PF 7360 කැබ් රථය සඳහා අවශ්‍ය maxis ටයර් 4 ගෙන්වීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව නිව් විජය මෝටර්ස්, ගාල්ල වෙතින් PF 7360 කැබ් රථය සඳහා අවශ්‍ය maxis ටයර් 4 ගෙන්වීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

2020.11.02 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2020 ඔක්තෝම්බර් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව නොවැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 ඔක්තෝම්බර් මාසයට අදාළ මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය නොවැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 ඔක්තෝම්බර් මාසයට අදාළ මාසික ඒකාබද්ධ වැය සාරාංශය නොවැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. පසුගිය දවස්වල මාගේ සහෝදරයාගේ අභාවය සිදු වූ අවස්ථාවෙ, නාගොඩ ප්‍රාදේශීය සභාවෙ ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ඒ වෙලාවෙ මාව තනි නොකර මට මහා ශක්තියක් ලබා දුන්නා. ඒ පිළිබඳව ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාට මාගේ ගෞරවණීය ස්තූතිය පුදකර සිටිනවා. ඒ වගේම දැනගන්න බැරි වෙලා දුරකතනයෙන් සංවේගය ප්‍රකාශ කළ මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලටත්, ඒ වගේම සහභාගි වීමට නොහැකි වූ සියලු දෙනාටමත්, අපේ පවුලේ ස්තූතිය මේ වෙලාවෙ පුද කරනවා. ඒ වගේම ප්‍රාදේශීය සභාවේ නිලධාරී මහත්ම මහත්මීන් හා ලේකම්තුමිය ඇතුලු හැම දෙනාටම අපේ පවුලේ ස්තූතිය මේ අවස්ථාවෙ පුදකර සිටිනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, ගිය සභා වාරෙ මම සිහිපත් කිරීම් කීපයක් කළා. උඩුගම බංගම පාරෙ නාම පුවරුව සවිකීරීම පිළිබඳව මීට කාලෙකට පෙර සිටම ඉල්ලීම් කරලා තිබුනා. ඒකෙ තත්වය මොකක්ද? කරන්න පුලුවන්ද? මොකද දිස්ත්‍රික් මායිම, නාගොඩ ප්‍රාදේශීය සභා සීමාව පිහිටා තියෙන ස්ථානය. එහි දැඩි අවශ්‍යතාවයක් තියෙනවා. එම ස්ථානයේ කලින් බෝඩ් එකක් තිබුනා. පාලම හදන අවස්ථාවෙ, මම හිතන්නෙ එය ගලවල ඉවත් කරලා.

ඊලගට උඩුගම නැගෙනහිර පාලම පිළිබඳව කතා කළා. ඒ පිළිබඳව ඔබතුමා පියවර ගත්තා කිව්වා. ඒකට ලියුම් යොමු කලාද? පසුගිය කාලෙ මිනිස්සු එකතුවෙලා, අපි කැගහල කටයුතු කළාම, කොන්ත්‍රාත්කරු ඇවිල්ලා වැඩ පටන් ගත්තා. දැන් සති දෙකකින් විතර ආපහු එන්නෙ නැහැ. එයාගෙ ක්‍රමය ඒක තමයි. කැගහන කොට චුට්ටක් වැඩ කරනවා අතහැරල දාල යනවා. ගල්බැදි දොල ආනන්ද විජය විද්‍යාලය අසලින් එගොඩට තියෙන පාලම, ජනසවිය ගම්මානයට යන පාලම. ගල් බැදි දොල පාලම කියල තමයි නම් කරල තියෙන්නෙ. ඒ ඉංජිනේරු මහත්මයා මේක බලන්නත් ඇවිල්ලා, අපිත් ඉදිරිපිට මිනිස්සුත් ගෙන්නලා මිනිස්සුට කිව්වා. අනිවාර්යයෙන්ම ඊලග සදුදා ඉදලා වැඩ පටන් ගන්නවා. කරගෙන යනවා කියලා. ඊලග සදුදා ඇවිල්ලා චුට්ටක් වැඩ කරලා, දැන් ආපහු නවත්වලා. කොන්ත්‍රාත් කරුගෙ නොම්මරය තියෙනවා දැන් මම ගත්තට ගන්නෙ නැහැ.

ඊලගට පසුගිය සභා වාරයේ උඩුගම දකුණෙ ත්‍රීවිල් රථ සංගමයෙන් ඉල්ලීමක් කරල තිබුනා. ඒකට ලිපියක් යොමු කරන්න කියලා, මම එදත් අදහසක් ඉදිරිපත් කළා. මොකද අපි සභාවෙ ගිනිපු තීන්දුව, ඒ අය දැනගත්තාම, අපට මගදි කතා බහ කරලා අහන්න අවශ්‍ය නැහැ. ඒ ලියුම ගිහිල්ලා නැහැ. මොකද මට ඊයෙත් කතා කරලා ඇහුවා. ඉතිං මම කිව්වා සභාවෙන් මෙන්න මෙහෙම තීන්දුවක් ගත්තා. ඒක ඔය ගොල්ලන්ට දැනුම් දෙයි කියලා. ඒ නිසා ඒ දැනුම් දීම කරන්න වෙනවා.

ඊලගට සභාපතිතුමනි, මෙන්න මේ කරුණ සිදු කිරීමේ හැකියාව තියෙනවද කියලා බලන්න. උඩුගම නැගෙනහිර ප්‍රදේශයේ ප්‍රජා ශාලාවක් තියෙනවා. ඒක පාවිච්චි කරන්නෙම නැහැ. අතහැරලා දාල වගේ තියෙන්නෙ. ඒක ගමේ මැදත් නෙවෙයි. කෙලවරේම අක්කර අසූව ප්‍රදේශය කිට්ටුව තියෙන්නෙ. ග්‍රාම නිලධාරී සහ අනිකුත් නිලධාරීවරු ඉන්නෙ බදු කාමරවල. ඒකට රජයේ මුදල් වැයවන්නෙ. ඒක නිසා මේ ශාලාව අරගෙන සකස් කරලා නිලධාරීන්ට පාවිච්චියට දෙන්න මිනිස්සුන්ගෙ යෝජනාවක් තිබුනා. ඒකෙ කාමර දෙකක් තියෙනවා. නිලධාරීන් විසින් භාවිතා කරන විට මේ ප්‍රජා ශාලාව නඩත්තු වෙනවා. ඒක මම ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් ඇහුවම එතුමිය කියනවා. අපට එහෙම කරන්න බැහැ. සභාවෙන් ඒක නීත්‍යානුකූලව ප්‍රාදේශීය ලේකම්තුමියට පවරල දෙන්න ඕන කියලා. එහෙම කරන්න හැකියාවක් තියෙනවද? කරනවද? ඒක දැනටමත් අභාවයට යමින් පවතින්නෙ. ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉඩම් කොටසක් වෙන්කරගෙන මන්ත්‍රී ප්‍රතිපාදනවලින් හදල තියෙන්නෙ. ප්‍රජා ශාලාව අයිති අපට. ඒ නිසා මේ නිලධාරීන් සදහා මේ කාමර පාවිච්චි කරන්න කියලා ඔබතුමා ප්‍රාදේශීය ලේකම්තුමියට දැනුම් දෙන්න. එතකොට මිනිස්සුන්ගෙ කාලයත් ඉතිරි වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි දීර්ඝ වශයෙන් කතා කරන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි මම ඉස්සෙල්ලම යෝජනා කරනවා. 2021 වර්ෂයට ආදායම් රැස් කිරීමට අදාළ යෝජනාව අනුව අපි බදු මුදල් ගන්න ක්‍රීඩා පිටි පිළිබඳ නාම ලේඛනයක් තියෙනවා. අපේ වත්කම් පිටට යන්න දෙන්න එපා. බීඩී පහ ක්‍රීඩා පිටිය නීත්‍යානුකූලව ඔප්පු තිරප්පු ඔක්කොම මාර්ගයෙන් මේ සභාවට එවකට මම ගත්තෙ. ඒකෙ කිසිම අඩුපාඩුවක් නැහැ. මුදල් වියදම් කළා. ඒක නිසා ඒ වගේ සභාව සතු වත්කම් කරුණාකරලා ඇතුලත් කරන්න. ඔය වගේ අතහැරල දැම්මොත්, අපේ බල ප්‍රදේශය තුල තියෙන අපේ වත්කම් ටික ආරක්ෂා කරගන්න අපට බැරිවෙනවා. විශේෂයෙන් මම මේක කියවල බැලුවා. බීඩී පහ ක්‍රීඩාපිටිය මෙයට ඇතුලත් කරලා නැහැ. උඩුගම දකුණ ක්‍රීඩා පිටිවලට යම්කිසි සංවර්ධන වැඩ කරලා, ගෙවීම් කරන්න ගියහම, ඔය වගේ අතහැරල දැමීම තුල, ප්‍රශ්න ආවා. ඒක නිසා මම හිතනවා ඉස්සෙල්ලම මේ අපේ තියෙන වත්කම් ටික ආරක්ෂා කරගන්න ඕන. දැන් අපි බැලුවොතින්, තල්ගස්වල පෙරපාසල අපේ භූමියක තියෙන්නෙ. ඒවා නීත්‍යානුකූල තත්වයෙන්ම තිබුනා. මම දන්නෙ නැහැ ඒවා දැනට මොන තත්වෙ තියෙනවද කියන එක. මේවා සභාව සතු වත්කම්. මම යෝජනා කරනවා. ඉවත් කරන්න එපා. ඒවා පොත්පත්වල ඒ ආකාරයෙන්ම ඇති. මේවට ඔප්පු

තප්පු ඔක්කොම තිබුනා. නව නගරය සංවර්ධනය කිරීමේදි, නාගොඩ ප්‍රාදේශීය සභාවට ඒ කැබැල්ල වෙන්කරලා තිබුනා. ඒක ඊට පස්සෙ වෙන කෙනෙක් වවලා තිබුනා. ඊට පස්සෙ මම සභාපති වුනාට පස්සෙ ගිහිල්ලා ආපහු නැවත අත්පත් කරගත්තා. මේ වගේ වත්කම් අනාගතය වෙනුවෙන් ආරක්ෂා කරන්න මම යෝජනා කරනවා. බීඩී පහ ක්‍රීඩා පිටිය, පොදු කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩම, වෙනත් පුද්ගලයො අයිති කරගෙන, මේ ආරවුල බේරගන්න බැරිවුණා. අවසානයේ නාකියදෙනියෙ වතුයායෙන් ක්‍රීඩාපිටිය සඳහා ඉඩම වෙන්කර ගත්තා. ඒ වගේම අලුත්වත්තෙත් එහෙමයි. අජිත් මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසෙ පෙරපාසල අසළ ඉඩමට ඔප්පුව ලැබුණා. මේ විදිහට ලැබුනා. සභාවෙ කොහේහරි මේවා ඇති. කවුරුවත් ගෙදර ගෙනියන්න නැහැ. ඒක නිසා සභාව සතු වත්කම් ටික ආරක්‍ෂා කර ගන්න හැටියට මම නැවතත් යෝජනා කරනවා.

ඊළඟට, මට දැන් මෙතන ඉන්න කොට ඌරල උතුර ග්‍රාම නිලධාරීතුමාගෙන් කොල් එකක් එනවා. ඔබතුමා පැමිනිල්ලක් දාල තියෙනවා. පාරෙ බෝඩ් එකක් හොරු ගැලෙව්වයි කියලා. ඒ පිළිබඳ විස්තරයක් ගන්නෙයි කිව්වා. ඒ එක්කම පොලීසියෙන් තව කෝල් එකක් එනවා. පාරෙ බෝඩ් එකක් හොරු ගලවපු සිද්ධියක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවෙන් ලිපියක් යොමු කරල තියෙනවා කියලා. ඒ පිළිබඳව තොරතුරු ඇහුවා. මම කිව්වා මට කියන්න දෙයක් නැහැ. කියන්න තියෙන දේ දැන් කියලා තියෙන්නෙ. මම දැන් සභාවෙ ඉන්නෙ. එළියට ඇවිල්ල ඕන්නම් තව විස්තර කරන්නම් කියලා කිව්වා. අපි කණගාටු වෙමු. ඒක තමයි කල්මරණවයි කියලා මම එදා කිව්වෙ. මේ හොරකම සම්බන්ධයෙන් පොලීසියත් ක්‍රියාත්මකයි, රාලහාමිත් ක්‍රියාත්මකයි. ඇත්තටම කණගාටුයි. ඇත්තටම වේදනයි. මෙක ඒ මොහොතෙ පැමිනිල්ල දැම්ම නම්, මෙලහටත් හොරු අල්ලාගැනීමේ හැකියාව තිබුණා. සභාවෙ නිලධාරි සම්පූර්ණ වගකියන්න ඕන. පැහැදිලිව මම කියනවා. කෙනෙක් සීට් එකේ වාඩිවෙනව නම් ඒ වාඩිවෙන කොට දැනගෙන ඉන්න ඕන. මෙන්න මේක තමයි මට පැවරී තියෙන වගකීම කියන එක. වදුරඹ පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න කියලා කිව්වා. නමුත් ඒ කියලා අද තුන්වෙනි මාසෙ මේ සභාව තියෙන්නෙ. අද මගෙන් පොලීසියෙන් අහනවා. ඒ පිළිබඳව මොකක්ද කියන්න තියෙන්නෙ කියලා. එක නිලධාරියෙකුට වදුරඹට යන්න තිබුනා. කැබ් රථය දීල තියෙනවා. එතන්ට ගිහිල්ලා, මම මන්ත්‍රීවරයෙක් හැටි කියන දේ හරි මදිනම්, සභාපතිවරයට කෝල් එකක් දීලා, මම පැමිණිල්ලක් දාන්නද කියල අහන්න තිබුනා. මේ වත්කම් අපේ නිලධාරි ක්‍රියාත්මක වෙන්නෙ නැහැ කියල කියන්න බැහැ. මෙන්න ලැබිච්ච වෙලාව. තුන් මාසයක් ගිහිල්ලා. දැන් තමයි අහන්නෙ. ඔබතුමාල අනුමත කරනවනම්, අනුමත කරන්න. මේක මේ සභාවෙ කණගාටුදායක සිද්ධියක්. සභාපතිතුමනි, මම සභාවට ඇවිල්ලා වාඩි වෙන්නෙ මේක අපේය කියන හැඟීමක් තියෙන නිසා. දේශපාලන වශයෙන් අපි ක්ෂේත්‍ර දෙකක හිටියත්, අපිට අපේය කියන හැඟීම තියෙනවා. කියන අන්න ඒක නිසා මේ වගේ කල් මරන්න දෙන්න එපා. සභාපතිතුමා මෙතනදි දුර්වලයි, මම කණගාටුවෙන් හරි කියනවා. නිලධාරියට පැවරී තියෙන වගකීම ඇයි ඉෂ්ඨ කරන්නෙ නැත්තෙ කියල අහන්න. නැත්නම් කොමසාරිස්වරයට කියන්න මෙයාලත් එක්ක වැඩ කරන්න බැහැ කියලා. සභාපතිතුමා මීට වැඩිය සැලකිලිමත් වෙන්න කියන එක තමයි මම කියන්නෙ.

ඒ වගේම කොරෝනා ප්‍රශ්නය ඉතාමත්ම බරපතල ලෙස ඉදිරියට යනවා වදුරඹ ප්‍රදේශයේ අසල් වැසියෙක් හැටියට, මම තමුන්නාන්සෙලාට පුංචි පනිවිඩයක් දෙනවා. ඒ ප්‍රදේශයේ අපේ මන්ත්‍රීවරියෙකුත් ඉන්නවා. මම හිතන්නෙ රටේ තත්වය මේකද කියන එකයි අපට තියෙන කණගාටුව. තමුන්නාන්සෙලා මාධ්‍ය මගින් දැක්කද වදුරඹ ප්‍රදේශයෙන් කොරෝනා හැදිච්ච කෙනෙක් හම්බ වෙලා ඉන්නවයි කියලා. මොනම මාධ්‍යකින්වත් මම නම් දැක්කෙ නැහැ. ඇසින් දුටු සාක්ෂි වගේ තමයි අපට කියන්න තියෙන්නෙ. ඔහු පොලිස් නිලධාරියෙක් හැටියට පොලීසියෙන් පැනලා ඇවිල්ලා, වදුරඹ මංසන්දියේ ස්ථාන කීපයක ගැවසිලා තියෙනවා. නමුත් මේ මොහොත වෙනකොට මාධ්‍ය තුලින් කිසිම කෙනෙක් දැනුවත් වුනේ නැහැ. ඒ පුද්ගලයා ගියපු ආපු සේරම කඩ විවෘත්තයි. මොකක්ද මේ බරපතල කාරණයක් සම්බන්ධයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තියෙන තත්වය.

අපි හැමදේකටම ඒ නගරයට යනවා. ඒක අපේ සභාවට අයත් නොවුනත් එතනදි සැලකිල්ල මදිය කියන එක, රටේ පුරවැසියෙක් හැටියට කණගාටුවෙන් වුවද මතක් කරනවා. මොකද ඒ ස්ථාන සියල්ලම දැන් ගිහිල්ල බලන්න. ඒ ස්ථාන සියල්ලම විවෘත්තයි. තමුන්නාන්සෙල දන්නෙ නැහැ. අසල්වැසිය හැටියට මම දන්නවා. නමුත් තමුන්නාන්සෙලා දන්නෙ නැතුව ඒ තැන්වලට යන්න පුලුවන්. ඒක නිසා මේ පොකුරක් කරුමෙටවත් වදුරඹින් නිර්මානය වුනොතින්, අපි සියලු දෙනාටම බලපානවා. ඒක බද්දෙගම සභාවද, නාගොඩ සභාවද කියන එක නෙවෙයි. පුරවැසියො හැටියට අසල්වැසියො හැටියට අපි සියලු දෙනාටම බලපානවා. මම සෞඛ්‍ය නිලධාරින්ගෙන් ඇහුවාම කිව්වා. ඕක තමයි තත්වෙ මාධ්‍ය ගියපු තැන්වල විතරයි ඒවා ප්‍රචාරය වෙන්නෙ. අනිත් තැන්වල නෑ කියලා. ඒක තමයි ඇත්ත එහෙමනම් අපට හිතන්න තියෙන්නෙ. අපි දකිනවාට වැඩිය ප්‍රශ්නය බරපතලයි කියන එක. අපට නොපෙනෙන ලෝකයේ තව දේවල් තියෙනවා. ඒ නිසා අපි දකින දේ මේක. අනුරාධපුරෙන් කෙනෙක් මෙහේට ආවොත් වදුරඹ මෙහෙම දෙයක් තියෙනවද කියල දන්නෙ නැහැ. බද්දෙගමින්, නාගොඩින් ආවොත් විතරයි දන්නෙ. ඒක නිසා ඒ කණගාටුයි. සැලකිලිමත් වෙන්න. ඒ නිලධාරීන් මම හිතන්නෙ මේක දැනුම් දියයුතු තැන්වලට මීට වැඩිය සැළකිල්ලෙන් තීන්දු අරගෙන අදාළ කටයුතු කරන්න ඕන.

ඒ වගේම අද මේ මොහොත වෙනකොට අපි සතුටු වෙනවා. කොරෝනාවලට නෙවෙයි පැවති ආණ්ඩුව එදා විවේචනය කරද්දි, රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවෙන් එදා සුව සැරිය මේ රටට ගෙනැත් දුන්නා. මම ඒ එක්තරා රියදුරු මහත්තයෙක්ගෙන් ඇහුවා ගහපු ඩීසල් ප්‍රමාණය කොච්චරද කියලා. දන්නෙ නැහැ කිව්වා. මුලු රටේම තත්වය මේකයි කිව්වා. මේ සුව සැරිය නැතිවුනානම් අද කොරෝනාවලට මීට වැඩිය බරපතල ලෙස මුහුන දෙන්න අපට සිදුවෙනවා. ඒක නිසා අපි අපේ ගෞරවය පැවති රජයට පුද කරනවා. පැවති රජය හැටියට එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍ය වරයා ඒ සුව සැරිය ක්‍රියාත්මක කරන්න හදනකොට. මොකක්ද කිව්වෙ? ඔන්න යකඩ ගොඩක් ගේනවා. ඉන්දියාවට රට දෙන්න හදනවයි කියලා. ඒක නිසා අද අපි ඒ විවේචන මධ්‍යයේ ඒ කරපු කටයුත්ත ගැන අද අපිට සතුටු වෙන්න පුලුවන්. ඒකනිසා මේ වෙලාවෙ තමුන්නාන්සෙලට තව විනාඩි ගණනකින් සම්බන්ධීකරණ කමිටුවට යන්න තියෙන නිසා, මම වැඩිය කතා කරන්නෙ නැහැ. කොහොම වුනත් අපි අපේ ප්‍රදේශයේ සෞඛ්‍ය තත්වය ආරක්ෂා කරගෙන, මෙතනදි අපි මීට වැඩිය සැළකිල්ලෙන් කටයුතු කරන්න ඕන. මම හිතන්නෙ අපේ සභාවෙ වුනානම් අපි සියලු දෙනාම ඒ පිළිබඳව මීට වැඩිය කතා කරාවි. මම මේක තමුන්නාන්සෙලට මතක් කළේ. ඊයෙ එතන වුනොත් හෙට මෙතන වෙන්න පුලුවන්. අපි මෙතන වුනොත් ගන්න ඕන තීන්දුව මොකක්ද කියන එක පිළිබඳව අපි සියලු දෙනාම වගකීමකින් යුතුව ඒ කටයුත්ත කරන්න ඕන නිසා. ඒක නිසා මේ වෙලාවෙ තමුන්නාන්සෙලා, අපි සියලු දෙනාම මේ රටේ වත්මන් තත්වය දිහා බලනකොට අපි කණගාටු වෙනවා. හෙට දවස වෙනකොට අපි සියලු දෙනාටම නිදුක් නිරෝගී සමාජයක් බිහි වේවායි ප්‍රාර්ථනය කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මම පොඩි ඉල්ලීමක් කරනවා. ලිඛිතව ඉල්ලන්න බැරි වුනත් උඩවැලිවිටිය ප්‍රදේශයේ මාර්ග කීපයක්ම යලිත් කැලේ වැවිල තියෙනවා. මේ සඳහා තණ කොල මැෂින් දෙකත් කම්කරුවො ටිකත් ලබා දෙන්න කියන ඉල්ලීම පළමුවෙන්ම කරනවා.

ඒ වගේම මේ අවස්ථාවෙ අපේ අජිත් එඩේර ආරච්චි හිටපු සභාපතිතුමා අනියම් සේවකයින් පිළිබඳව කතා කළා. අපේ රජයේ වැඩපිළිවෙලක් හැටියට රැකියා ලක්ෂයෙන් යම් ප්‍රමාණයක් සභාවට ආදේශ කරන්න බලාපොරොත්තු වෙනවයි කියන එක මීට කලින් දැනුම් දීල තියෙනවා. ඒ කොහොම වුනත් අපි අනියම් සහ තාවකාලික රියදුරන් තුන්දෙනෙක්, විදුලි කාර්මික මහත්මයෙක් මුරකරු අනියම් ඒ වගේම සෞඛ්‍ය කම්කරු වැඩ ක්ෂේත්‍ර කම්කරු, මෙන්න මේ වගේ ඇතැම් අයට මම හොයල

බැලුවම, දැනට මේ චක්‍ර ලේඛය අනුව ස්ථිර කරන්න සුදුසුකම් තිබෙනවා. නමුත් මේ සඳහා සුදුසුකම් නැති අයත් මේ අතරෙ ඉන්නවා. ඒ අනුව මේ රැකියා ලක්ෂය අනුව පී එල් 1 කියන ප්‍රාථමික අංශයට ඉදිරි කාලෙදි අධ්‍යාපන සුදුසුකම් සංශෝධනයක් ඒවි කියලා මම විශ්වාස කරනවා. මොකද මේ තනතුරු සඳහා බඳවා ගන්න බලාපොරොත්තු වෙන්නෙ අට සමත් කියන පරිච්ඡේදයෙන් තමයි. ඒ අනුව අපේ සභාවෙ ඉන්න ගොඩක් අය 2015 වර්ෂයේ විතර බඳවා ගත්තු අය. ඒ අයටත් සාධාරණයක් වෙන්න ඕන. නැත්නම් ඒ සඳහා අපේ ගරු සභාපතිතුමාට අපි යෝජනා කරනවා. අපේ හිටපු සහබන්දු සභාපතිතුමා මතක් කළා වගේ. සභාපතිවරු සංසදයට මේක ජාතික වැඩපිළිවෙලක් හැටියට කටයුතු කරලා, මේ සඳහා ඔබතුමාගේ ශක්තිය අපේ සභාවේ කම්කරුවන් වෙනුවෙනුත් යොදවන්න කියන ඉල්ලීමත්, මේ වෙලාවෙ සිදු කරනවා.

ඒ වගේම අපි රටක් හැටියට සියලුම දෙනාටම සෞඛ්‍යමය අතින් ඉතාම භයංකාර අඳුරු යුගයක් උදා වෙමින් පවතිනවා. මොකද මේ වසංගතය ශ්‍රී ලංකා වාසී අපට පමණක් නෙවෙයි. ලෝක වාසී සියලු දෙනාට මේ සඳහා මුහුණ දෙන්න සිදු වෙලා තියෙනවා. ඒ නිසා විශේෂයෙන් රජයක් හැටියට උපරිමයෙන් කටයුතු කරනවා වගේම. මහජනයා ඒ සඳහා වගකීමෙන් වැඩකටයුතු නොකළොත්, අපිටත් මෑත කාලයේදීම ඒ රෝගයට ගොදුරු වෙන්න ඉඩකඩ ලැබෙනවා. ඒ නිසා මේ කොට්ඨාසවල මහජන නියෝජිතයින් හැටියට අපටත් දෙන්න පුලුවන් නායකත්වයක් ලබාදී ප්‍රාදේශීය සභා මට්ටමින් යමක් කරන්න පුලුවන්කම තියෙනවනම්, ඒ සඳහා අපේ උපරිම ශක්තිය යොදවන්නට, අපේ ගරු සභාපතිතුමා ඇතුලු අපි සියලු දෙනාට අවශ්‍ය පසු බිම සැකසේවායි කියල පතමින්, නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මම මේක කිහිප අවස්ථාවකම ප්‍රකාශ කළා. උඩවැලිවිටියෙ ජලයෝජනා ක්‍රමය එක් පුද්ගලයෙක් තනිවම භුක්ති විඳිනවා. අපේ සභාව සතු සභාවෙ වත්තකමක්, සභාවෙ ටැංකිය, සභාවෙ මුදල් මේ සියල්ලම වැය කළේ සභාවෙ මුදල්. ටැංකිය හයිකරපු භූමියේ ජලය බෙදා නොහැර එක් පුද්ගලයෙක් නතර කරගෙන ඉන්නවා. දැන් එතනින් එහාට වතුර බෙදා හරින්නෙ නැතිලු. මම දන්නෙ නැහැ. මේ මොහොත වෙනකොට හරියාකාරව ක්‍රියාත්මක වෙනවද කියන එක. මට එහෙන් පැමිණිලි එනවා. කතා කරනවා. එතන ජලය බෙදාහැරීම නතර කරගෙන ඉන්නවයි කියලා. කරුණාකරලා ඒක සොයා බලන්න. ඔබතුමාම යන්න. මේක සභාවෙ දෙයක්. හැම සතයක්ම සභාවෙන් වියදම් කරල තියෙන්නෙ. ඒක නිසා එක් පුද්ගලයකුට පමණක් නෙමෙයි දීලා තියෙන්නෙ. ඒ වතුර ලයින් එක විවෘත්ත කරලා, අනිත් අයටත් වතුර ගන්න අවස්ථාව සකසා දෙන්න. නැත්නම් ඒ පුද්ගලයා වාහන හෝදන්න එයාගෙ සුඛ විහරණය සඳහා අපේ සල්ලි වියදම් කරනවයි කියල තමයි මට දැනෙන්නෙ.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි මේ සම්බන්ධයෙන් මමත් පොඩි එකතු කිරීමක් කරන්න ඕන. මේ අපේ සහබන්දු මන්ත්‍රීතුමාගෙ කාලෙ තමයි ඒ ජල යෝජනා ක්‍රමය නිර්මාණය කරලා, ඒක සකස් කරලා තිබුනේ. නමුත් දැන් ඒකෙ පොඩි වියදමක් අපට දරන්න වෙනවා. දැනට අපේ තාක්ෂණ නිලධාරියෙක් යොදවලා, මේ ජල ව්‍යාපෘතිය පිළිබඳ සොයා බලලා, අවශ්‍ය වතුර බට පිළිබඳ අධ්‍යයනය කරලා සකස් කල යුතු තැන් සකස් කරලා, ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු කරන්න අවශ්‍යයි. සමහර වෙලාවට ටැංකියට එන බට අවහිර වෙලා තියෙනවා. ටැංකියත් එතනින් ඉවත් කළොත් හොඳයි කියලා මම හිතනවා. මොකද ව්‍යාපාරයක් කරන ස්ථානයක් ඒකටත් අවහිරයි. මේ ව්‍යාපෘතිය පටන් ගනිද්දි සද්භාවයෙන් ස්ථානය ලබා දුන්නට, ඒ වෙලාවෙ මේ ව්‍යාපාරය එතන තිබුනෙ නැහැ. එයාගෙත්

කැමැත්ත තියෙනවා. ටැංකිය එතනින් වෙනත් තැනකට ගන්නවට. නන්දන මන්ත්‍රීතුමා කියනවා වගේ ඔහුට ඒ භූමියෙ වාණිජ වටනාකමකුත් ඇති බව මටත් තේරෙනවා. ඒ නිසා අපි ටැංකිය එතනින් ඉවත් කළොත් හොඳයි. තාක්ෂණ නිලධාරී මහත්තයෙක් යොදවල ඒ කටයුතු කරන්න. මම මේ වෙලාවෙ යෝජනාවක් හැටියට ඒ කටයුතු සිදු කරන්න කියල ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, කාල වේලාව ඉක්මයන නිසා මට පොඩි කරුණක් කියන්න තියෙනවා. යම් සමාජ සේවකයෙක් වශයෙන්, අපි සද්භාවයෙන් දෙයක් කළාට, පස්සෙ. ඒ පිළිබඳව යම් මන්ත්‍රීවරයෙක් යමක් කරනවානම්, ඒකට මම කියන්නෙ වින කරනවයි කියලා. මම පහුගිය දවසක මේ ප්‍රදේශයේ ගොවිජන කමිටුවෙ සභාපති වශයෙන්, පොහොර ටොන් 19 ක් ආපු කෘෂි කර්ම දෙපාර්තමේන්තුවෙ ලොරිය කන්ද අදින්න බැරුව නතර වුනා. ඊට පස්සෙ රෑ 12 විතර ගිහිල්ලා, පෞද්ගලිකව මගේ ලොරියට පොහොර ටික පටවලා, ඒක මම ගෙදර අරගෙන ආවෙ, මේ ගමේ ජනතාවට බෙදල දෙන්න. එතකොට ඒකෙ නිලධාරීන් සමග එකතු වෙලා යම් මන්ත්‍රීවරයෙක්, සිරස මාධ්‍යට කතා කරලා. මගේ වෙලාවට, මොකද ඒක ගේන්න ක්‍රමවේද තිබුනා. නමුත් මම රෑ ගිහිල්ලා ලොග් සටහන් පොතේ අත්සන් කරවලා, ඒව කළේ නැහැ. ඒක මම ගෙදර අරගෙන ආවා. පොහොර කොට්ට 80 ක් ගෙනාවයි කියන එක සිරසෙන් කතා කරල සභාපතිතුමාගෙන් අහන කොට තමයි දන්නෙ. සභාපතිතුමා මගෙන් ඇහුව හින්ද තමයි මම ඉක්මණින් ඒකෙන් නිදහස් වෙන්න අවශ්‍ය ලිපි ලේඛන හැදුවෙ. හැබැයි ඒ පොහොර ටික ගෙනැල්ලා මම කළේ ගමේ ජනතාවට බෙදා දෙන්න කටයුතු කරපු එක. අද මගේ ගමේ කිසිම කෙනෙකුට පොහොර හිගයක් නැතුව, කුඹුරු කරපු අයට පොහොර දුන්නා. ඉතිං එහෙම කරන්න එපා. මොකද තමන්ගෙ කොට්ඨාසෙ විතරක් නෙවෙයි. කොහේ හරි, මම නම් හිතන්නෙ එහෙමයි. අද පොහොර ලෝඩ් එකක් එනවා. දැන් උදේ සභාපතිතුමා කතා කළා. ගම්මැද්දෙගොඩ ප්‍රදේශයට පොහොර ඇත්තෙම නැහැ. ඉතිං මේ වෙලාවෙ පොහොර හිගයක් රටේ තියෙද්දි, අපි මහන්සි වෙලා, රෑ ගිහිල්ලා පොහොර ටික ගෙන්නලා, මේ ප්‍රදේශයට බෙදා දෙද්දි, ඒ වගේ කටයුතු කරන්න එපා. ඒකට මට කියන්න වචනයක් නැහැ. මේ සභාවට ගැලපේද මම දන්නෙ නැහැ. එහෙම වැඩ කරන අය ඉන්නවනම්, ඒක ඇත්තටම මම හෙලා දකිනවා. මොකද එහෙම කරන්න එපා. තමන්ට නැති වුනාට කමක් නැහැ. මොන පක්ෂෙ වුනත් කමක් නැහැ. අනිත් කෙනෙකුට උදවු කරලා, ඒ වැඩ කරන්න කියලා මතක් කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. මේ වෙලාවෙ වැඩි වෙලාවක් ගන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, අපේ සහබන්දු විපක්ෂ නායකතුමා කතා කරපු වගේ, පහුගිය කාලෙ කොවිඩ් වසංගතයත් එක්ක මටත් යම් කරුණක් මතක් කරන්න වෙනවා. මේ අවස්ථාවෙ. කොවිඩ් දෙවෙනි රැල්ල ආරම්භ වෙනවත් එක්කම අපි නියෝජනය කරන උඩුගම ප්‍රදේශයෙන් රෝගියෙක් හමු වුනා. ඒ එක්කම මම පළවෙනි කොවිඩ් රැල්ල එක්ක සංසංදනය කළාම, මීට කලින් කිසිම රෝගියෙක් වාර්තා නොවුනු කාලේ, අපි සභාව විදිහටත්, ඊටත් පස්සෙ සමාජ මට්ටමෙන් සහ ඒ සෞඛ්‍ය අංශවලින් කරපු යම් සේවාවක් පහුගිය කාලෙ අපි දැක්කා. නමුත් ඒ රෝගීන් වාර්තා වෙන්න කලින් කරපු සේවාව දැන් දකින්න නැහැ. මෙම දෙවනි රැල්ලත් එක්ක රෝගීන් වාර්තා වෙන්නෙ අපේ ප්‍රදේශයේ. විශේෂයෙන්ම අපේ සහබන්දු මන්ත්‍රීතුමා කතා කළේ සභාවෙන් පිට අපට ආසන්න නගරයක් ගැන. නමුත් අපේම ප්‍රදේශයේ රෝගියෙක් වාර්තා වෙන වෙලාවෙ වත්, සභාව විදිහට මේ සභාවෙන්වත්, එහෙම නැත්නම් ඒ අදාල සෞඛ්‍ය අංශයෙන්වත්, ඒ සේවාව සිදු වුනේ නැහැයි කියන පනිවිඩය මේ සභාවෙ කණගාටුවෙන් වුනත් කියන්න ඕන. අපට මතකයි වෙරංග මන්ත්‍රීතුමාලා මීට මාස ගණනකට කලින් පසුගිය කොවිඩ් රැල්ල අවස්ථාවේ

පුද්ගලිකවත් මැදිහත් වෙලා, වතු සමාගම් එක්ක එකතු වෙලා, අපට කරන්න පුලුවන් ආකාරයෙන් අපිත් දායක වෙලා, යම් යම් විශබීජානුහරන කටයුතු වගේ අපට පුලුවන් මට්ටමේ, ප්‍රාථමික මට්ටමේ වැඩ, අපි පුද්ගලිකවත්, අපි මැදිහත් වෙලා කළා. නමුත් මේ සභාව විදිහට, මේ අංශයට වගකීමක් තියෙන ආයතනයක් විදිහට, කිසිම සෙවිල්ලක් බැලිල්ලක් ඒ සම්බන්ධව සිදු වුනේ නැති බව මේ අවස්ථාවෙ කණගාටුවෙන් මතක් කරනවා. අඩුම ගානෙ ඒ අදාල රෝගියා නොදැනුවත්ව හරි ගියපු ආපු ප්‍රදේශයක් තිබුනා. පීසීආර් 25 ක් විතර සතියකට පස්සෙ විතර කළා. නමුත් ඒ මග දෙපැත්තවත් විශබීජානුහරනය කරන්නවත් යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළේ නැහැ. ඒ සතියක් පුරාවට මම මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට දුරකතනයෙන් ඇමතුවම, ඒ අය කිව්වා දැන් ඉතින් පහුවෙලා වැඩියි. ඒ වෙලාවෙ අපට කරන්න ශක්තියක් තිබුනෙ නැහැ. ඒකට මුදල් නැහැ. එවැනි කටයුත්තක් තමයි ඔවුන් ප්‍රකාශ කළේ. නමුත් අපේ සභාවෙ ගෙවීම් වාර්තාව බැලුවම මෙපමන ලීටර් ගණනක් විෂබීජානුහරණ ක්‍රියාවලියට වැය කරලා තියෙනවා ඩෙංගුවලට මෙපමන ප්‍රමාණයක් වැය කරලා තියෙනවා. කොවිඩ් මර්ධනයට මෙපමන වියදම් කරලා තියෙනවා. නමුත් මේ අවශ්‍යම වෙලාවෙ ඒ කටයුත්ත අපේ ප්‍රදේශවල සිද්ද නොවුන කියන කාරණය මේ අවස්ථාවෙදි නැවතත් මතක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේක වෙලාව නොවුනත් නැගී හිටපු වෙලාවෙ උඩුගම පොළ ගැන කතා කරන්න ඕන. පසුගිය කාලෙත් මම හිතන්නෙ අපේ වෙරංග මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසෙ මුදල්වලින්, ලක්ෂ 10 ක වගේ මුදලක් ඒ සදහා යොදවලා, සංවර්ධන කටයුතු කළ බව ගිය සභාවෙදි ප්‍රකාශ කළා. ඇත්තටම අපි වෙරංග මන්ත්‍රීතුමා ප්‍රධාන ඒ කොට්ඨාසයට ස්තූති වන්ත වෙනවා. ඒ වගේම මම හිතන්නෙ උඩුගම පොළ කොවිඩ් වසංගතයත් එක්ක දැන් මේ වෙනකොට වහපු පොළක්. මම සභාපතිතුමත් එක්ක දුරකතනයෙන් කතා කරපු වෙලාවෙ, එතුමත් කිව්වෙ. නව ගොඩනැගිලි වලට පොළ ගෙනියන්න අවශ්‍ය කටයුතු කරමු කියලා. ඊයෙ දිනයෙදි පාර දෙපැත්තෙ පොඩි පොළක් තිබුනා. නමුත් ගරු සභාපතිතුමනි, ඒ තියෙන තාවකාලික පොළෙන්, ස්ථිර ගොඩනැගිල්ලට පොළ ගෙනියන්න සහ ඒ අවශ්‍ය මූලික පහසුකම් ඇති කරන්න මේ නිවාඩුව අවස්ථාව කර ගන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද ඊයෙත් ඒ වෙළෙන්දන් එක්ක කතා කළාම ඔවුන් කිව්වෙ. ඔවුන්ට වතුර නැහැ. වැසිකිලිවලට යන්න විදිහක් නැහැ. ඒකෙ මූලික පහසුකම් ලබා දීල තිබුනට, ඒ අයට සතියකට සැරයක් පාවිච්චි කරන පොළට, අඩුගානෙ අවශ්‍ය වතුරත් නැති නිසා තමයි ඒවා පාවිච්චි කරන්න බැරි තත්වයේ තියෙන්නෙ. එම පහසුකම් ලබා දෙන්න. අපි ඒ ස්ථානයට යන්නම් කියලා. ඉතිං ඒ ගැන මැදිහත් වෙලා, මේ නිවාඩුවෙදි ඒ ගැන කතා කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ සභාවෙ ඔබතුමා පාවිච්චි කරන රථය හැර අන් කිසිම වාහනයක නඩත්තුව ගැන සෑහීමකට පත්වෙන්න බැහැ. මම හිතන්නෙ අපේ මන්ත්‍රීතුමන්ලා සියලුම දෙනා දන්නවා. ඒ වාහන දැක්කම ඒ වාහන මේ සභාවක තියෙන වාහනද කියල හිතෙනවා. පොලීසියෙනම් වාහනයක් මාසෙකට සැරයක් ඒඑස්පී හරි ඇවිල්ලා ඉන්ස්පෙක්ෂන් එකක් කරනවා. සභාවෙ මම හිතන්නෙ සභාපතිතුමාවත්, ඒ අදාල නිලධාරියෙක්වත් මේ ගැන සොයා බලන්නෙ නැද්ද. මම දන්නෙ නැහැ. ඒ සම්බන්ධව නිලධාරි පත්කරලත් නැහැ. ඔබතුමා පාවිච්චි කරන වාහනේනම් අද වෙනකොටත් ඒ විදිහට තියෙනවා. නමුත් ඒ ඇර කිසිම වාහනයක් මනා නඩත්තුවක් කෙරෙන පාටක් නැහැ. ඒ ගැන යම් නිලධාරියෙක් පත් කරලා අවශ්‍ය කටයුතු කරන්න. මොකද උඩුගම උපකාර්යාලයට ගියාම, අපේ මන්ත්‍රීතුමන්ල බලන්න. ඒකෙ එහා පැත්තෙ තියෙන වාහන තොගය. මම හිතන්නෙ සභාපතිතුමාවත්, ලේකම්තුමියවත් දන්නෙ නැතුව ඇති. අපට ටැක්ටර් කීයක් තියෙනවද? අපට ලොරි කීයක් තියෙනවද? අපට ට්‍රේලර් කීයක් තියෙනවද? ලෑන්ඩ්මාස්ටර් තියෙනවද? ඒ තියෙන වාහන ගැනවත් දන්නෙ නැතුව ඇති. ඒ එකක්වත් පරණ වාහන නෙවෙයි. හොද ලක්ෂ 50, 60 වටින වාහන පාවිච්චි නොකර එකතැන දිරාපත් වෙමින් තියෙනවා. ඇත්තටම

ඒවා යම් දේකට ප්‍රතිඵලයක් ගන්න පුලුවන් ආකාරයට යොදවන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අවසාන වශයෙන්, අපේ ප්‍රියන්ති මන්ත්‍රීතුමිය මීට පෙර නැගී සිට. එතුමියගෙ සහෝදරයගෙ මළ ගෙයක් ගැන දැන්වුවම තමයි ඒ සම්බන්ධව ඇත්තටම මම නම් දැනුවත් වුනේ. ගරු සභාපතිතුමනි, මේ සභාවෙ මම හිතන්නෙ ඔබතුමාලගෙ ගෙදරත් මළ ගෙයක් තිබුනා. ඊට කලින් උප සභාපතිතුමාලගෙ ගෙදර මළ ගෙයක් තිබුනා. ඉතිං ඇත්තටම මේක මහා දෙයක් නෙවෙයි. මේක රාජකාරීමය වශයෙන් කෙරෙන්න ඕනද නැද්ද කියලා මම දන්නෙ නැහැ. නමුත් මේ සභාවෙ කරන දේවලුත් එක්ක බැලුවම, අඩුම ගානෙ මේ සභාවෙ සභාපතිතුමාගෙ ගෙදර තියෙන මල ගේ ගැනවත්, මේ මන්ත්‍රීවරයෙක්ගෙ ගෙදර තියෙන මළ ගෙයක් ගැනවත් දුරකතනයෙන්වත් මේ මන්ත්‍රීවරු ඉතුරු 26 දෙනාට දැනුම් දීමක් කරන්න බැරිනම්, ඒක මම හිතන්නෙ ඉතාමත් කණගාටුවට කරුණක්. මේ සභාවෙ නිලධාරීන්ට එච්චරම වැඩ වැඩිද? එහෙම නැත්නම් ඒ ක්‍රමවේදයක් සකස් කරල නැද්ද කියල මම දන්නෙ නැහැ. එහෙම වුනාම මේ වගේ ස්ථානවලට ඇවිල්ලා අපි අපහසුතාවයට පත්වෙනවා. ඒ සඳහා වහාම කඩිනම් පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සභාවෙ ලේකම්තුමිය ප්‍රධාන සියලු දෙනාගෙන් අවසරයි. මම අද දවසෙ දීර්ඝව කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. කරුණු දෙකක් සම්බන්ධව කෙටියෙන් සඳහන් කරලා මම අවසන් කරනවා. මුලින්ම ගරු සභාපතිතුමනි, අපේ පළාතෙ තියෙන ගව ප්‍රශ්නෙයි, සුනඛ ප්‍රශ්නෙයි පිළිබඳව නැවත වාරයක් මතක් කරනවා. මොකද මේ දිනවල බොහොම අමාරුවෙන් මිනිස්සු කුඹුරු ටික, පුරං වෙච්ච කුඹුරුත් එක්ක වගා කරනවා. හැබැයි මේ ගව ප්‍රශ්නෙ නිසා ගොවීන්ට ඉදිරියෙදි ලොකු ගැටලුවකට මුහුන දෙන්න වෙනවා. විශේෂයෙන්ම ගෙවතු වගාව, මොකද මමත් ගෙවත්තක් කරනවා. මගේ නිවස ඉස්සරහ මම අල බතල එහෙම ඉන්දල තියෙනවා. ඊයෙත් හරක් 20 ක් විතර ඇවිල්ලා, කොරටුවම විනාශ කරන්න හැදුවා. යන්තම් එලව ගත්තා. වැටවල් ගහල තියෙද්දි, වැටවල් කඩාගෙන එන එළ හරක් 50, 75 ක විතර රංචුවක් ඉන්නවා. මේ හරක් රංචුව මේ පළාතෙම තියෙන ගෙවතු වගා විනාශ කරනවා. ඔබතුමාට මම සභාවාර දෙක තුනකදිම මේ ගවයන්ගෙන්, සුනඛයන්ගෙන් වන හානිය පිළිබඳව සිහිපත් කළා. මම හිතන්නෙ මේ වෙලාවෙ ඔබතුමාට තමයි බලය තියෙන්නෙ. මේ ගව ප්‍රශ්නය පිළිබද වගකීම ඔබතුමාට භාර ගන්න වෙනවා. ගොවිජන සේවා කාර්යාලය තිබුනත්, ඔබතුමා සභාවෙ සභාපතිවරයා හැටියට, මේ ප්‍රශ්නෙට කුමක් හෝ විසඳුමක් ලබා දෙන්න වෙනවා. මොකද ඉදිරියෙදි තව සති කීපයක් යන කොට, මේ කුඹුරු වගා කරනවා. වපුරනවා. ඒ නිසා නැවත වාරයක් මේ පිළිබද අවදානය යොමු කරලා මේ ගැටලුව විසදන්න කියලා ඔබතුමාට සිහිපත් කරනවා. නැත්නම් මේ මිනිස්සු බොහොම අමාරුවෙන් ගෙවත්තෙ වගා කරපු අල, බතල, මඤ්ඤොක්කා ටිකත්, එලවළු ටිකත් ඒ වගේම කුඹුරු ටිකත් මේ ගව රැන විසින් විනාශ කරනවා. ඒ නිසා ඒ පිළිබඳව මුලින්ම සඳහන් කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, මේ වෙලාවෙ විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕන. සියලු දෙනා කතා කළා වගේ. අද අපේ රටේත්, පිටරටවල් වලට වගේම භයානක තත්වයක් උදාවෙලා තියෙනවා. මේ කොවිඩ් 19 වසංගතය දැනට තුන්වෙනි රැල්ලට පා තබලා තියෙනවා. තරංග මන්ත්‍රීතුමත්, සභබන්දු හිටපු සභාපතිතුමත් කිව්වා වගේ. අපි දැක්කා පහුගිය කාලයේ මේ පවතින ආණ්ඩුව. පළවෙනි අදියරේ කොවිඩ් රැල්ලට මුහුන දුන්නෙ කොහොමද කියලා. හැබැයි මේ දෙවෙනි රැල්ල, තුන්වෙනි රැල්ල ආණ්ඩුව අතහැරල දාල තියෙනවා. මොකද විශේෂයෙන්ම සඳහන් කරන්න ඕන. අපි මේ කොවිඩ් වැඩසටහනේ ප්‍රධානියා හැටියට අපේ ශවේන්ද්‍ර සිල්වා යුද හමුදාපතිතුමා. ඉතා දක්ෂ

නිලධාරියෙක්. එතුමා යුද්ධය ඉවර කළා වගේ, ඒ පළවෙනි කොවිඩ් රැල්ලත් මර්ධනය කරන්න රජයට සහයෝගය ලබා දුන්නා. නමුත් කොවිඩ් පළමු රැල්ලෙ හිටපු ප්‍රධාන නිලධාරින් අද වෙනකොට, එක එක්කෙනා එහාට මෙහාට මාරු කරලා, මේ දේශපාලන හිතවත්කම්වලට ඒ ප්‍රධානීන් පත්කර ගෙන, අද මේ දේශපාලන වැඩපිළිවෙලත් එක්ක කොරෝනා තුන්වෙනි රැල්ලට අද අපේ ජනතාවට මුහුන දෙන්න සිදු වෙලා තියෙනවා. ඇත්තටම අර තරංග මන්ත්‍රීතුමන් කිව්ව වගේ, රෝගියෙක් හඳුනගත්තට පස්සෙ, ඒ ප්‍රධාන පොසිටිව් වුන රෝගියා හා සම්බන්ධ අනිත් අය පීසීආර් කරන්න, සති ගණනක් යනවා. මොකද පීසීආර් කරන වැඩපිළිවෙල ඉතාමත් දුර්වලයි. සභාපතිතුමනි, ඉදිරියෙදි අපට දැඩි අවදානමක් තියෙනවා. මොකද මේ පීසීආර් කරන වැඩසටහන රජයේ බොහොම ඇල්මැරුණු ගතියෙන් යන්නෙ. ඒ නිසා මේවා හරි භයානක දේවල්. දේශපාලනය කරනවා වගේම, රටේ ජනතාව ආරක්ෂා කරගැනීමත්, වත්මන් රජයේ වගකීමක්. මොකද ඉදිරියෙදි මේ ආණ්ඩුව මේ කොවිඩ් වැඩසටහන අයාලේ යන්න ඉඩ අරින ආකාරයක් අපි දකිනවා. මීට වැඩිය තමන්ගේ වගකීම යුතුකම ජනතාවට ඉටු කරන්න කියලා මේ වෙලාවෙ සිහිපත් කරනවා.

ඒ වගේම තව එක කරුණක් සඳහන් කරනවා. සභාපතිතුමනි, පොහොර පිළිබඳව ධර්මසිරි මන්ත්‍රීතුමන් කිව්වා. ඇති තරම් පොහොර දෙනවයි කියලා. හැබැයි මමත් දැන් ගිහිල්ලා පොහොර අර ගත්තා. වී කුරුණි 10 කට දීපු පොහොර ප්‍රමාණය බැලුවයින් පස්සෙ, ඉදිරි කාලයේදී කුඹුරට යොදන්න අපට සල්ලිවලටත් පොහොර ගන්න වෙනවා. මොකද පොහොර නියමිත ප්‍රමාණයට වඩා බොහොම අඩුවෙන් දෙන්නෙ. නොමිලෙ දෙනවා තමයි. නමුත් දෙන ප්‍රමාණය බොහොම අඩුයි. පොහොර ගනිපු රිසිට් එකේ තියෙනවා. වී කුරුණි 12 ටම අපේ වචනයෙන් කිව්වොත්, කැට පොහොර කිලෝ 07 යි තියෙන්නෙ. මේ වගේ අනිත් පොහොර යූරියා 27 යි. ඊලගට එම් ඕ පී 30 යි. නමුත් කැට පොහොර තමයි කුඹුරු ගොවිතැනේ මුල් අවදියෙදි අත්‍යවශ්‍ය වෙන්නෙ. ඉතිං මේවා බොහොම අඩුවෙන් දෙන්නෙ. පහුගිය කාලෙ පොහොර හිගයක් තිබුනත්, අද යම් මට්ටමකට තේ වගාවටත් පොහොර ලැබිලා තියෙනවා. නමුත් අත්‍යාවශ්‍ය පොහොර නැහැ. අද ආණ්ඩුව ඉතාමත් අසීරු, අමාරු කාල වකවානුවක, සිටින බව අපිට පේනවා. පහුගිය කාලෙ ජනතාව දිව්‍ය ලෝකෙ යවන්න වගේ කතා කළා. නමුත් අද දිව්‍ය ලෝකෙ නෙවෙයි එදාවේල ජීවත් වෙන්න බැරුව, හාල් කිලෝ එක 100 යි. සීනි කිලෝ එක කීයද? පරිප්පු එක කීයද? රට ඇනු එක 360 යි. මෙන්න ජනතාවට කන්න දෙන හැටි. මේක තමයි හැමදාම රාජපක්ෂවරු පාලනය ගත්තයින් පස්සෙ ජනතාවට අත්වෙන ඉරනම. මම ඒ පිළිබඳත් ඉතාමත් කෙටියෙන් සඳහන් කරනවා, ජනතාව නොමරා මරන ආණ්ඩුවක් අද තියෙන්නෙ. ඒක නිසා මේවට ඉදිරියෙදි ජනතාව තීන්දු තීරණ ගනීවි. ඒ නිසා සියලු දෙනා කිව්ව වගේ, මේ වෙලාවෙ අපි අපේ ප්‍රදේශය කොවිඩ් වසංගතයෙන් බේර ගන්න, අපි සභාවෙ මන්ත්‍රීවරු හැටියට එකතුවෙලා, කටයුතු කරමුයි කියලා සිහිපත් කරමින්, මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාගෙන් අවසරයි. දැන් සභාවෙ ප්‍රකාශ වුන පරිදි මම කැමතියි. ඊ 12.00 වෙනකල් වුනත් සභාවෙ කරුණු සාකච්ඡා වෙනවට. ඒක මට ප්‍රශ්නයක් නෙවෙයි. ඇත්තටම පළමුවෙන්ම කතා වුනේ. පස්වරු 1.00 ට විශේෂ සංවර්ධන කමිටු රැස්වීම තියෙන බැවින්, සභාවෙ සියලුම මන්ත්‍රීවරු එයට සහභාගි වෙන්න ඕන නිසා. සභා රැස්වීම ප.ව. 1.00 වෙන කොට නතර කරමු කියලා. ඒකයි මම වසන්ත මන්ත්‍රීතුමාට

කතාව කෙටි කරන්න කිව්වෙ. නැතුව එතුමා ප්‍රකාශ කළ අදහස් නිසා නෙවෙයි. සංවර්ධන කමිටු රැස්වීමට සහභාගි වෙන්න ඕන නිසා. ඒකයි මම මන්ත්‍රීවරුන්ට කිව්වෙ ප.ව. 1.00 ට සභාව අවසන් කරමු කියලා. ඒ පිළිබඳව වැරදි වැටහීමක් නොගන්නා මෙන් ඉල්ලන අතර, මේ අවස්ථාවේ මම ස්තූතියක් කරන්නත් අදහස් කරනවා. ඒ පසුගියදාඅප නාගොඩ නිවසේ තිබුන මාගේ ඥාති සහෝදරයාගේ අභාවය වෙනුවෙන් පැමිණසහයෝගය ලබා දුන් උපසභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සහ ලේකම්තුමිය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට මෙන්ම, අවස්ථානුකූලව සභාවේ සම්පත් භාවිතා කරමින්, මට මහත් සහයෝගය ලබා දීම පිළිබඳවත්, ස්තූතිය ප්‍රකාශ කිරීම පිළිබඳව. තවද මේ අවස්ථාවේ අප නිවසින් ලබා දුන් ස්තූති ලිපිය සභාවට යොමු කරනවා.

කොහොම නමුත් මම වැඩිය යමක් කියන්න යන්නෙ නැහැ. මන්ත්‍රීවරුන්ගෙ අදහස් යම් ප්‍රමාණයකට ප්‍රකාශ වුනා. මන්ත්‍රීවරුන්ගෙ අදහස් මම වටහා ගෙන වනිගරත්න මන්ත්‍රීතුමත් ඒ වගේම සහබන්දු මන්ත්‍රීතුමත්, ලක්රුවන් මන්ත්‍රීතුමා, ධර්මසිරි මන්ත්‍රීතුමා, තරංග මන්ත්‍රීතුමා සියලු දෙනා ප්‍රකාශ කල කරුණු මම අහගෙන හිටියෙ. වනිගරත්න මන්ත්‍රීතුමා ප්‍රකාශ කල උඩුගම - බංගම පාරේ පාලම අසළ නාගොඩ ප්‍රාදේශීය සභා සීමාව දැක්වෙන නාම පුවරුවක් සවි කිරීමේ කටයුත්ත යථා කාලයේදී සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම උඩුගම නැගෙනහිර ආනන්ද විජය විද්‍යාලය අසළින් ජනසවිය ගම්මානයට පිවිසෙන ගල්බැදි දොළ පාලමේ කටයුතු සිදු කරන කොන්ත්‍රාත්කරුගේ දුරකථන අංකය දෙන්න. මම ඔහුට කතා කරන්නම්.

ඒ වගේම වනිගරත්න මන්ත්‍රීතුමන් ප්‍රකාශ කල උඩුගම දකුණ ත්‍රීවිල් රථ සංගමය මගින් කරන ලද ඉල්ලීමට සභාව මගින් ගත් තීරණය දැණුම් දී ලිපියක් යොමු කරන ලෙස මම දැනුම් දුන්නා. ලේකම්තුමිය ඒ පිළිබඳ නැවත සොයා බලන්න.

ගරු වනිගරත්න මන්ත්‍රීතුමනි, උඩුගම නැගෙනහිර ප්‍රජා ශාලාවේ අයිතිය සතු වන්නේ කාටදැයි ප්‍රාදේශීය ලේකම්තුමිය නොදන්නවා ඇති. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව මැදිහත් වී කටයුතු කරන්න. යම් අළුත්වැඩියා කටයුත්තක් කිරීමට තිබේ නම්, ඒවා සොයා බලා සිදු කර ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡා කර නිලධාරීන් සඳහා පාවිච්චියට ලබා දීමට කටයුතු කරමු. නමුත් ප්‍රජා ශාලාව සභාව සතු දේපලක් බැවින් ප්‍රජා ශාලාවේ අයිතිය ප්‍රාදේශීය ලේකම්තුමියට නීත්‍යානුකූලව පැවරිය නොහැකි බවත්, ප්‍රකාශ කරනවා.

ඒ වගේම වෙරංග මන්ත්‍රීතුමාලගෙ ගෙවල් ලග තියෙන අපේ ප්‍රජා ශාලාවත් ඒ වගේ. එම ස්ථානයේ එහා පැත්තට වෙන්න ඉදිකිරීමකුත් කරලා තියෙනවා. ගරු මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව සොයා බලා කටයුතු කරන්න.

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා සහ ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ප්‍රකාශ කල උඩවැලිවිටිය ජල යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරී යොදවා, ඒ ගැන සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

අපේ සභාවෙන් කොවිඩ් වසංගතය සම්බන්ධයෙන් කටයුතු කළේ නැහැ කියලා අපේ තරංග මන්ත්‍රීතුමා කිව්වා. ඔබ නොදන්නව වුනාට අපි විෂබීජහරණය කළා. මේ වෙන කොටත් විෂබීජහරණ කටයුතු කරනවා. අපෙන් ඉල්ලීම් කළ ප්‍රධාන ස්ථානවල, උඩුගම උසාවිය, බැංකුව අපෙන් කරන ලද ඉල්ලීමට අනුව ඒ කටයුතු කළා. ගරු මන්ත්‍රීතුමා අපට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු නියෝග දෙන විදිහට තමයි අපි කටයුතු කරන්නෙ. නැතුව අපි ගිහිල්ල සොයාගෙන නෙවෙයි. අපට බැහැ අපේ එක්කෙනෙක් විෂබීජ තියෙන තැන්වලට දාන්න. මොකද මේ අය සෞඛ්‍ය අංශයේ අය නෙවෙයි. මොකද එයාලට මම වග කියන්න ඕන. මම එයාලට කිව්වා අපේ උප කාර්යාලයේ පීසීආර් කරපු ස්ථානය විෂබීජහරණය කරන්න කියලා. ඊලගට තල්ගස්වල ප්‍රදේශයේ විෂබීජහරණ කටයුතු

කළා. කොවිඩ් ආසාදිත රෝගියාගේ හරි ආශ්‍රිතයන්ට අදාළ ස්ථාන විෂබීජහරණය කරන්න, අපට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු කියන්න ඕන. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු තමයි අපට දැනුම් දෙන්නෙ මේ ස්ථානවල විෂබීජහරණ කටයුතු කරන්න කියලා. නැතුව අපට කරන්න බැහැ. සභාවෙන් ඒ කටයුතු ඇත්තටම කෙරුනා. ඊලගට කොවිඩ් රෝගය සම්බන්ධයෙන් ප්‍රචාරන කටයුතු සිදු කළා. දහ වතාවකට වැඩිය මුලු බල ප්‍රදේශයේම ප්‍රචාරය ගියා. ඊලගට අපි අපේ තියෙන සම්පත් එක්ක තමයි කටයුතු කරන්නෙ. අපෙන් තමයි මේවට වියදම. අපේ සභාවෙන් විෂබීජහරණ කටයුතු ඒ හැම දේම කළා. ඊලගට ඔබතුමා පොළ පිළිබදව කතා කළා. පොළ පිළිබදව පොළේ සංවර්ධන කටයුතු පිළිබදව දැන් අද දවසෙත් අපි කතා කළා. පොලේ ඉතිරි කටයුතු ඒ ආකාරයෙන් සිදු වෙනවා.

ඒ වගේම කුඹුරු පොහොර පිළිබදව කතා කළා. පසුගිය කාලයේ පොහොර හිගයක් තිබුණා. දැන් හිගයක් නැතුව පොහොර තියෙනවා. මේ වන විටත් කුඹුරු පොහොර ලොරියක් කෘෂිකර්ම මධ්‍යස්ථානයට එවන බවට දන්වා තිබුණා. මේ ලෝකෙටම බලපාපු කොවිඩ් වසංගතයත් එක්ක යම් යම් සැපයුම් අපහසුතා තියෙනවා. ආර්ථික අවපාත නිසා ගොඩක් අඩුපාඩු වෙනවා. නමුත් අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් ගෙන යන මේ වැඩ ව්‍යාපාරය පිළිබඳව අපි සතුටු වෙන්න ඕන. පළවෙනි කොවිඩ් රැල්ල වගේම දෙවනි කොවිඩ් රැල්ලත් ඉතා ඉක්මනින්ම අපි නිම කරන බව කියන්න සතුටුයි. මොකද වෙන රටවල්වලට වඩා කොවිඩ් ව්‍යාප්තිය මර්ධනය කරන්න අවශ්‍ය කටයුතු හොඳට කරගෙන යනවා. ගෝඨාභය ජනාධිපතිදුන්ගෙත්, ඒ හමුදා සෞඛ්‍ය අංශවල කාර්යභාරය නිසියාකාරයෙන් කරන බව අපට පේනවා. නැත්නම් මේ හැම තැනම, තල්ගස්වල කෙනෙක් පොසිටිව් වුන ගමන් මේ මුලු ප්‍රදේශයම පොසිටිව් වෙන්න ඕන. උඩුගම පුද්ගලයා පොසිටිව් වුන ගමන් මුළු උඩුගම ප්‍රදේශයම පොසිටිව් වෙන්න ඕන. නමුත් ඒක දැනගත්ත විගස, පළවෙනි පෙළ ආශ්‍රිතයන්, දෙවනි පෙළ ආශ්‍රිතයන් වශයෙන් සියළු දෙනා ආරක්ෂා කරලා, ඒ කටයුතු කළා. එහෙම නැත්නම් අද වෙනකොට මුලු බල ප්‍රදේශයේම කොවිඩ් ව්‍යාප්ත වෙලා. එවැනි දක්ෂ පරිපූර්ණ නිලධාරි මණ්ඩලයක් එක්ක ජනාධිපතිතුමා වැඩ කරනවා. ඒ නිසා අපි මේ ගැන සතුටු වෙන්න ඕන. නැත්නම් අපි මේක දැකලා වෙනත් ආකාරයකින් සතුටු වෙන්න නරකයි. ඒ නිසා මම කියන්නෙ මේක අපි කාටත් මුහුණ දෙන්න සිදු වුන වසංගතයක්. ඒ නිසා අපි සියලු දෙනාම මේකෙන් ආරක්ෂා වෙන්නනම්, දේශපාලන වාද බේද වලින් තොරව, අපි එකා වගේ වැඩ කරන්න ඕන. ඒත් එක්කම වෙනත් ප්‍රශ්න මේ අවස්ථාවෙ කතා නොකරනවනම් තමයි වඩාත් හොඳ. මොකද අපි පළවෙනියට අපේ සෞඛ්‍ය ප්‍රශ්නෙ ගැන කතා කරලා, අපි සුරැකිලා හිටියොත් තමයි අපට හැමදේම කරන්න පුලුවන් වෙන්නෙ කියලා මම කියනවා. එහෙමනම් මම මීට වඩා යමක් කියන්න යන්නෙ නැහැ. ඇත්තටම අද සභාව ආරම්භයේ සිටම සියළු දෙනා සහයෝගෙන් සුහද ශීලීව කටයුතු කළා.

ඒ වගේම මම ගරු මන්ත්‍රීවරුන්ට කියනවා. අයවැය කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරලා, ඒකෙ අඩුපාඩු තියෙනවනම්, සියලුම මන්ත්‍රීවරුන් තමන්ගෙ බල ප්‍රදේශයට අදාළව හොඳ යෝජනාවක් එකක් වෙන්න දෙන්න. එතකොට ඒක ලබන අයවැයට ඉදිරිපත් කරලා, අයවැය කෙටුම්පත සංශෝධනය කරලා, අපට ඒක කරන්න පුලුවන්. ඒ ඔබතුමන්ලගෙ යෝජනා අපට කරන්න පුලුවන් ආකාරයට කරන්න යථාකාලෙදි අපි බලාපොරොත්තු වෙනවා. මොකද මේ වෙන කොට අපටත් යහපත් ප්‍රතිඵල ලැබෙමින් පවතිනවා. මොකද පසුගිය කාලවකවානුවල මුදල් තත්වය බොහොම දුර්වල තත්වයේ තිබුනත්, වර්ථමානයේ ඉන්න ගරු ආණ්ඩුකාරතුමා අපට යම් ප්‍රමාණයකට මුදල් දෙනවා. ඒ වගේම මම කියන්න සතුටුයි. අපේ ඇප්තොප් වත්ත අක්කර පහක බිම් කොටස තක්සේරු කර, පවරා ගැනීමේ කටයුතු සඳහාත් අපට මුදල් ලබා දීල තියෙනවා. හැබැයි එම මුදල අපට ලබා දී ඇත්තේ ඉදිරියෙදි අපට ලැබීමට නියමිත උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් අඩු කර ගැනීමේ පදනම මතයි. එවැනි කටයුතු වෙනවා. මේ අනුව ඉදිරියෙදි යම් සංවර්ධන ක්‍රියාදාමයන්

කරන්න පුලුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙමින්, අද පැමිණි උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාටම වර්තමානයේ ඇති වී ඇති මේ වසංගත තත්වයෙන් මිදී, සුවදායී හෙටක් ප්‍රාර්ථනා කරමින්, අද පැමිණ, සහයෝගය දැක්වූ සියලු මන්ත්‍රීතුමන්ලට, මන්ත්‍රීතුමියන්ලාට ස්තූති වන්ත වෙනවා. විශේෂයෙන්ම අද වේලාසනින් සභා රැස්වීමේ කටයුතු නිම කරන්න අවශ්‍යතාවය වුනේ විශේෂ සංවර්ධන කමිටුවට සහභාගී විය යුතු නිසා. ඒකටත් සියලු දෙනාගෙ සහභාගිත්වය බලාපොරොත්තු වෙමින්, සියලු දෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ජයවේවා!

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-